දුර්ලභ

# ධර්ම සූත්‍රවල - ප්‍රධාන වශයෙන් ගෞතම ධර්ම සූත්‍රයේ - හා ත්‍රිපිටකයේ - ප්‍රධාන වශයෙන් විනය පිටකයේ - ඇතුළත් ධර්මනීති පිළිබඳ තුලනාත්මක විමසීමක්

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ

1969 වර්ෂයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා

ර චි ත නි බ න්ධ ය

| ප්‍රවේශ අංකය | 16 |
| --- | --- |
| වර්ග අංකය | |

වරායයේ රාහුල හිමි

1 9 7 0

## පරිච්ඡේද පෙළගැස්ම

පරිච්ඡේද පහකින් සමන්විත මෙම නිබන්ධයේ ආරම්භක පරිච්ඡේදයෙන් විස්තර වන්නේ ශික්ෂිත පිවිතුරු දිවියක් ගත කිරීමේ අගය වටහා ගත් භාරතීයයන් ඒ වෙනුවෙන් ක්‍රියා කළ ආකාරයයි. ධර්මශබ්දයේ අර්ථය පිළිබඳ ව මෙහි දී කරුණු දැක්වෙන්නේ ධර්ම නීති පිළිබඳ තුලනයක දී ඒ ඒ අවස්ථාවෙහි ධර්මය යනු කුමක්දැ යි තෝරා ගැනීම වැදගත් වන බැවිනි.

දෙවන පරිච්ඡේදය ධර්ම සූත්‍රයන්හි විස්තර වන සාමාජික බෙදීම් වශයෙන් සැලකිය හැකි වර්ණ භේදය හා බ්‍රහ්මචාරි, ගෘහස්ථ, වානප්‍රස්ථ හා සන්‍යාසි යන ආශ්‍රම සතරට අදාළ මූලික වෙනස්කම් ද බුදු දහම අනුව දැක්විය හැකි ගිහියා හා පැවිද්දා අතර දක්නා මූලික වෙනස්කම් ද පිළිබඳ ව කරුණු පැහැදිලි කෙරේ.

තුන්වැනි පරිච්ඡේදයට විෂය වන්නේ එක් එක් ජීවනාවස්ථාවට අදාළ නියමයන් වෙනස් වන අයුරුයි. මේ අනුව බ්‍රහ්මචාරී ආශ්‍රමය ගෘහස්ථ ආශ්‍රමයෙන් වෙනස් වන අයුරුත් වානප්‍රස්ථ හා සන්‍යාසි ආශ්‍රම ගෘහස්ථ ආශ්‍රමයෙන් වෙනස් වන අයුරුත්, ඇතැම් නීති ආශ්‍රම දෙකකට හෝ වැඩි ගණනකට පොදුවේ පවත්නා අයුරුත් පැහැදිලි කෙරෙන්නේ බෞද්ධ ගිහියා හා පැවිද්දා පිළිබඳ නියමයන් සමග තුලනය කෙරෙමිනි.

සතරවැනි පරිච්ඡේදය ධර්ම සූත්‍රවලට හා බුදු දහමට පොදු වශයෙන් ගත හැකි ආචාර ධර්ම රාශියක් වෙන් වශයෙන් පරීක්ෂා කරනු සඳහා කැප වේ. අනුමාතෘකා යොදා නැති වුව ද පහත සඳහන් පරිදි එහි අනුමාතෘකා යෙදිය හැකිය.

අහිංසාව

මාංශානුභවය

ඉන්ද්‍රිය සංයමය

බ්‍රහ්මචර්‍යාව

1 අදත්තාදාන විරතිය හා මුසාවාද විරතිය

සුරාපාන විරතිය

උදකශුද්ධිය

ධාර්මික ජීවිකාව

අල්පේච්ඡතාව

2 ආගන්තුක සත්කාරය

දන් දීම

ආචාර්‍ය සේවාව

මව්පිය උපස්ථානය

3 ප්‍රිය වාග් ව්‍යවහාරය

අභිවාදනය

4 ආගමික වරප්‍රසාද

අවසාන වූ පස්වැනි පරිච්ඡේදයෙන් ජීවිතයේ පරමාර්ථය වෙත අවධානය යොමු වේ. බුදු දහමෙහි දැක්වෙන නිර්වාණය හා උපනිෂද් යුගයෙහි පටන් සැලකිල්ලට භාජන වූ බ්‍රහ්මන් තත්ත්වය පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කෙරේ.

මෙම පරිච්ඡේදයේ අවසානය නිබන්ධයේ අන්තර්ගත කරුණු සමස්තයක් වශයෙන් ගෙන ලුහුඬින් සංගෘහිතය.